# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


**අංක 2,202 - 2020 නොවැම්බර් මස 13 වැනි සිකුරාදා - 2020.11.13**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |
| රජයේ නිවේදන ... ... ... | 1302 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 1307 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


*සැ. යු.* -(i) ඇප (සංශෝධන) පනත් කෙටුම්පත 2020 ඔක්තෝබර් මස 29 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් *භාරගැනීම ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි** *ගැසට් පත්‍රය* **පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2020 දෙසැම්බර් මස 04 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2020 නොවැම්බර් මස 20 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*''යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2020 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*


1301 – B 82077 — 402 (2020/11)
A 1-

# රජයේ නිවේදනය

මගේ අංකය : ආර්ජී/එන්බී/11/2/64/2020/පිටු/සැ.

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනත

මෙහි පහත උපලේඛනයෙහි දෙවැනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වැනි තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමුවන තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව, තාවකාලිකව සකස් කර ඇති බැවි ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනතේ 4 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ 2020.11.13 වැනි දින සිට 2020.11.27 වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 10.00 සිට ප. ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී පරීක්ෂාකර බැලිය හැකි ය.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම්කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධත්වය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග 2020.12.04 වැනි දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

කේ. ජී. ධර්මතිලක
රෙජිස්ට්‍රාර් ජනරාල්,

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

**උපලේඛනය**

| *ලියාපදිංචි පොත්වල කැඩී බිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වැල්ල කොට්ඨාසයේ 42 වෙළුමේ 237, 238 පත්‍රිරු. | බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, පල්ලේ පත්තුවේ, සල්පිටි කෝරළේ, 60 වන පාර වැල්ලවත්තෙ හි පිහිටි ''මැදන්ගහවත්ත හෙවත් ගුරුන්නාන්සේලාගේ මැදන්ගහවත්ත හෙවත් කහටගහවත්ත'' නමැති ඉඩමට එන්. වොලෙන්හෝවන් මිනින්දෝරු මහතාගේ අංක 273/1941.03.01 දරන පිඹුරේ ලොට් A සඳහා මායිම්,<br><br>උතුරට : 60 වන පාර,<br>නැගෙනහිරට : ලොට් 05<br>දකුණට : ලොට් 186 ලොට් ඒ2<br>බස්නාහිරට : ලොට් 03.<br>බිම් ප්‍රමාණය : අ. 0, රූ. 0, පර්. 19.12 | 01. සී. වී. ප්‍රනාන්දු ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කරන ලද 1941.10.29 වැනි දින අංක 17 දරන තෑගි ඔප්පුව. |

මගේ අංකය : ආර්ජී/එන්බී/11/2/62/2020/පිටු/සැ.

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනත

මෙහි පහත උපලේඛනයෙහි දෙවැනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වැනි තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමුවන තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව, තාවකාලිකව සකස් කර ඇති බැව් ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනතේ 4 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ 2020.11.13 වැනි දින සිට 2020.11.27 වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 10.00 සිට ප. ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී පරීක්ෂාකර බැලිය හැකි ය.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම්කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධත්වය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග 2020.12.04 වැනි දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය ෑ

කේ. ජී. ධර්මතිලක,
රෙජිස්ට්‍රාර් ජනරාල්,

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

#### උපලේඛනය

| *ලියාපදිංචි පොත්වල කැඩී බිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| කොළඹ දිස්ත්‍රික්කයේ, දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් කොට්ඨාසයේ 3039 වෙළුමේ 54 පත්ඉරුව. | බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, පල්ලේ පත්තුවේ, සල්පිටි කෝරළේ, රත්මලානෙහි පිහිටි '' උස්වත්ත සහ සියඹලාගහවත්ත සහ ඕවිට'' නමැති ඉඩමට බලයලත් මානක ඒ. හෙට්ටිගේ මහතා විසින් 2005.03.05 දින මැන සාදන ලද අංක 4136ඒ දරන පිඹුරේ ලොට් 10 සඳහා මායිම්<br><br>උතුරට ෑ ලොට් 15,<br>නැගෙනහිරට ෑ වකින්දාරාම පන්සලට අයත් දේපළ හා වකින්දාරාම පාර වරිපනම් අංක 61/4 ද,<br>දකුණට ෑ ලොට් 11 ද,<br>බස්නාහිරට ෑ ලොට් 13 ද,<br>බිම් ප්‍රමාණය ෑ අ. 0, රූ. 0, පර්. 12 | 01. එම්. ඒ. සී. එස්. ජයසූරිය ප්‍රසිද්ධ නොතාරිස් විසින් සහතික කරන ලද 2007.03.29 වැනි දින අංක 482 දරන විකුණුම් ඔප්පුව.<br><br>02. එස්. එන්. එන්. ද සිල්වා ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කරන ලද 2007.03.29 දින අංක 2904 දරන උකස් ඔප්පුව |

මගේ අංකය : ආර්ජී/එන්බී/11/2/42/2020/පිටු/සැ.

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනත

මෙහි පහත උපලේඛනයෙහි දෙවැනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වැනි තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමුවන තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව, තාවකාලිකව සකස් කර ඇති බැව් ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනතේ 4 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ 2020.11.13 වැනි දින සිට 2020.11.27 වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 10.00 සිට ප. ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී පරීක්ෂාකර බැලිය හැකි ය.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම්කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධත්වය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග 2020.12.04 වැනි දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

කේ. ජී. ධර්මතිලක,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

**උපලේඛනය**

| *ලියාපදිංචි පොත්වල කැඩී බිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| කොළඹ දිස්ත්‍රික්කයේ, දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී කොට්ඨාසයේ 139 වෙළුමේ 239 පත්‍ඉරුව. | බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, පල්ලේ පත්තුවේ, හේවාගම් කෝරළේ, හෝකන්දර පිහිටි '' ඊපැක්දෙණියේකුඹුර'' නමැති ඉඩම සඳහා මායිම්,<br><br>උතුරට : නැකතිගේ කුඹුර,<br>නැගෙනහිරට : සිංගා හේනයාගේ කුඹුර<br>දකුණට : අමරසිංහගේ දොන් කොර්නේලිස් පොලිස් විදානරාළගේ වත්ත,<br>බස්නාහිරට : මෙම කුඹුරේ ඉරවැල්ල.<br>බිම් ප්‍රමාණය : මුල් බිජු වී බුසල් එකහමාරක් පමණ | 01. ඩී. වී. රණසිංහ ප්‍රසිද්ධ නොතාරිස් විසින් සහතික කරන ලද 1954.09.03 දින අංක 13392 දරන තෑගි ඔප්පුව. |

මගේ අංකය : ආර්ජී/එන්බී/11/2/103/2019/පිටු/සැ.

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනත

මෙහි පහත උපලේඛනයෙහි දෙවැනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වැනි තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමුවන තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව, තාවකාලිකව සකස් කර ඇති බැව් ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනතේ 4 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ 2020.11.13 වැනි දින සිට 2020.11.27 වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 10.00 සිට ප. ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී පරීක්ෂාකර බැලිය හැකි ය.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම්කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධත්වය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග 2020.12.04 වැනි දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

කේ. ජී. ධර්මතිලක,
රෙජිස්ට්‍රාර් ජනරාල්,

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

#### උපලේඛනය

| *ලියාපදිංචි පොත්වල කැඩී බිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| කොළඹ දිස්ත්‍රික්කයේ, දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී කොට්ඨාසයේ 289 වෙළුමේ 300ඒ පත්‍රිරුව. | බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, පල්ලෙ පත්තුවේ, හේවාගම් කෝරළේ, තලන්ගම පිහිටි '' ඇතුන්කේදෙණිය කුඹුර කොටස '' නමැති ඉඩමට මායිම්,<br><br>උතුරට : මෙම ඉඩමේම කොටස වත්මන් කුමාරගේට අයිති,<br>නැගෙනහිරට : මියගිය සේතන් ගුරුන්නාන්සේගේ ඉඩම,<br>දකුණට : වර්තමානයේ කේ. දෙන් ලේවිස් සිංඥෝට අයිති ඉඩම.<br>බස්නාහිරට : පාර.<br>බිම් ප්‍රමාණය : අ. 00, රූ. 01, පර්. 05. | 01. කේ. වයි. පෙරේරා ප්‍රසිද්ධ නොතාරිස් විසින් සහතික කරන ලද 1961.03.28 දින අංක 849 දරන විකුණුම් ඔප්පුව<br><br>02. ඒ. බී. ඩබ්. ජයසේකර ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කරන ලද 1994.04.08 දින අංක 11983 දරන විකුණුම් ගිවිසුම් ඔප්පුව අවලංගු කිරීමයි.<br><br>03. ඒ. බී. ඩබ්. ජයසේකර ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කරන ලද 1994.04.08 දින අංක 11984 දරන විකුණුම් ඔප්පුව.<br><br>04. ඒ. බී. ඩබ්. ජයසේකර ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කරන ලද 2000.02.05 දින අංක 13337 දරන එකඟවීමේ බලපත්‍රලාභී ගිවිසුමයි. |

මගේ අංකය : ආර්ජී/එන්බී/11/2/59/2020/පිටු/සැ.

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනත

මෙහි පහත උපලේඛනයෙහි දෙවැනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වැනි තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමුවන තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව, තාවකාලිකව සකස් කර ඇති බැව් ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනතේ 4 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ 2020.11.13 වැනි දින සිට 2020.11.27 වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 10.00 සිට ප. ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී පරීක්ෂාකර බැලිය හැකි ය.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම්කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධත්වය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග 2020.12.04 වැනි දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

කේ. ජී. ධර්මතිලක,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

### *උපලේඛනය*

| *ලියාපදිංචි පොත්වල කැඩී බිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| කොළඹ දිස්ත්‍රික්කයේ, දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී කොට්ඨාසයේ 1557 වෙළුමේ 163 පත්‍රිරුව | බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, පල්ලේ පත්තුවේ, හේවාගම් කෝරළේ, කලල්ගොඩ පිහිටි '' කලල්ගොඩ ලන්ද සහ කැකුණගහවත්ත '' නමැති ඉඩමට එම්. සමරනායක මිනින්දෝරු මහතාගේ අංක 6396/1999.01.03 දරන පිඹුරේ ලොට් 17බී සඳහා මායිම් :<br><br>උතුරට : ලොට් 17ඒ,<br>නැගෙනහිරට : 91 පිඹුරේ ලොට් 16<br>දකුණට : පියරත්නට අයිති ඉඩම,<br>බස්නාහිරට : ප්‍රසිද්ධ පාර,<br>බිම් ප්‍රමාණය : අ. 00, රූ. 00, පර්. 12. | 01. ප්‍රසිද්ධ නොතාරිස් එන්. ඩී. මාලගොඩ විසින් ලියා සහතික කරන ලද 2005.03.01 දින අංක 4943 දරන තෑගි ඔප්පුවයි. |

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව (HDFC බැංකුව)

### (කලින් කල සංශෝධිත) 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 303730000001

ණයකරුගේ සම්පූර්ණ නම : සෙත්මා ට්‍රේඩින් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්

මාතර ප්‍රසිද්ධ නොතාරිස් එම්. කේ. ආර්. ටී. නානායක්කාර විසින් 2019.06.07 දින ලියා සහතික කරන ලද අංක 654 දරන උකස් බැඳුම්කරය මගින් 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි අංක PV 4730 දරන ලංකාවේ නීත්‍යානුකූලව සංස්ථාගත කරන ලද සීමාසහිත පෞද්ගලික සමාගමක් වන මාතර, ඉස්දීන් නගරය, මීරා පාරේ, අංක 83 දරන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය පිහිටි සෙත්මා ට්‍රේඩින් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් වෙනුවෙන් එහි අධ්‍යක්ෂවරුන් වන සමන්ත ජයවික්‍රම හා දුෂ්‍යාන්ති අර්සුන්තා ජයවික්‍රම යන අය උකස්කරුවන් වශයෙන් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන (2003 අංක 15 සහ 2011 අංක 45 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනතින් සංශෝධිත) 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ඉහත කී උකස් බැඳුම්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

එකී සමන්ත ජයවික්‍රම හා දුෂ්‍යාන්ති අර්සුන්තා ජයවික්‍රම යන අය සෙත්මා ට්‍රේඩින් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමේ අධ්‍යක්ෂවරුන් වශයෙන් එම සමාගමේ පාලනය හා කළමණාකාරීත්වය දරන බැවින්, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව විසින් සෙත්මා ට්‍රේඩින් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමට ප්‍රදානය කරන ලද ණය මුදලේ නියම අර්ථලාභීන් වනුයේ, එකී සමාගම වෙනුවෙන් සමන්ත ජයවික්‍රම හා දුෂ්‍යාන්ති අර්සුන්තා ජයවික්‍රම යන අය වන හෙයින් ද,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් දෙකෝටි විසිහතර ලක්ෂ හතලිස්හය දහස් දෙසිය හැත්තෑතුන (රු. 22,446,273.00) ක මුදලක් වර්ෂ 2020.09.30 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(01) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් එක් කෝටි හැත්තෑහය ලක්ෂ තිස්අට දහස් හයසිය හැටඅටයි ශත හැටදෙක (රු. 17,638,668.62) ක මුදල ද වර්ෂ 2020.09.30 වන දින දක්වා හිඟ මුදල වශයෙන් රුපියල් හතලිස්අට ලක්ෂ හත් දහස් හයසිය හතරයි ශත තිස්අට (රු. 4,807,604.38) ක් ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් දෙකෝටි විසිහතර ලක්ෂ හතලිස්හය දහස් දෙසිය හැත්තෑතුන (රු. 22,446,273.00) ක් ද,

(02) එකී ණය මුදලෙහි ආපසු නොගෙවූ මුදල වන රුපියල් එක් කෝටි හැත්තෑහය ලක්ෂ තිස්අට දහස් හයසිය හැටඅටයි ශත හැටදෙක (රු. 17,638,668.62) ක මුදල මත අයවිය යුතු වර්ෂයකට 17.50% ක් බැගින් වූ පොලිය 2020.10.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා ද,

(03) 2020.10.01 දින සිට දේපල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) ඉහත කී සම්පූර්ණ හිඟ මුදල වන රුපියල් හතලිස්හත් ලක්ෂ අනූහත් දහස් අටසිය හතරයි ශත විසිඅට (රු. 4,797,804.28) ක මුදල මත මාසිකව 1.50% ක ප්‍රමාද පොලියක් අයකර ගැනීම සඳහා ද,

(04) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය යටතේ අයකල හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව වෙත උකස් කොට ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකරු පී. කේ. ඊ. සේනාපති යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 2011 අංක 01 දරන පනතින් සහ 2011 අංක 19 දරන පනතින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2020 ක් වූ ඔක්තෝබර් මස 28 වන දින පැවැති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී.

#### ඉහත කී උපලේඛනය

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මාතර කඩවත් සතර තුළ, මාතර මහ නගර සභා සීමාව තුළ සහ මාතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, අංක 414C - ඉස්දීන් නගරය ග්‍රාම නිලධාරී වසමේ හිත්තැටිය ග්‍රාමයෙහි පිහිටි මීරා පාරේ වරිපණම් අංක 83 දරන කහම්පලේ කුරුඳුවත්ත නොහොත් ඉස්දීන් නමැති ඉඩමට 2018.05.11 වන දින පී.එම්. අබේගුණවර්ධන බලයලත් මිනින්දෝරු තැන විසින් මැන සම්පාදිත අංක : 1207 පිඹුර ප්‍රකාර කැබලි අංක A2 නමැති ඉඩම් කොටසට මායිම්, උතුරට : කැබලි අංක A1 හා කැබලි අංක A3 ද, නැගෙනහිරට : කැබලි අංක 18 (වරිපණම් අංක 79 දරන) ද, දකුණට : පාරකට වෙන් කළ ඉඩම් කොටස ද සහ බටහිරට: කැබලි අංක 22 (වරිපණම් අංක 87 දරන) ද යන මායිම් තුළ පිහිටි පර්චස් විසිනවයයි දශම තුනක (අක්. 0-රූ. 0-පර්. 29.3) හෙවත් හෙක්ටෙයාර් බිංදුවයි දශම බිංදුවයි හතයි හතරයි එකයි බිංදුවක

(හෙක්. 0.07410) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් ගොඩනැගිලි, ගහකොළ පලතුරු ආදී සියළු දේ ද සමග මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක A861/17 හි ලියාපදිංචි කර ඇත.

මාතර ප්‍රසිද්ධ නොතාරිස් එම්.කේ.ආර්.ටී. නානායක්කාර විසින් 2019.06.07 දින ලියා සහතික කරන ලද අංක 654 දරන උකස් බැඳුම්කරය අනුව මෙහි දක්වා ඇති උපලේඛනය පරීක්ෂා කරන ලදී.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි

සාමාන්‍යාධිකාරිතුමා.

2020 ඔක්තෝබර් මස 28 වැනි දින,
ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව,
ජාතික නිවාස සංවර්ධන අධිකාරී ගොඩනැගිල්ල,
ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාර්ඩිනර් මාවත,
තැ. පෙ. 2085,
කොළඹ - 02.

11 - 189

---

**ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව (HDFC බැංකුව)**

(කලින් කල සංශෝධිත) 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය.

ණය අංක : 702725000071 සහ 702725000104
ණයකරුගේ සම්පූර්ණ නම : වීරවර්ණ කුලසූරියගේ සුමුදු ප්‍රියන්ත කුලසූරිය

පොළොන්නරුව ප්‍රසිද්ධ නොතාරිස් ආරියසේන ගාල්ලගේ විසින් 2017.05.25 දින ලියා සහතික කරන ලද අංක 3285 දරන උකස්කරය සහ එකී නොතාරිස් තැන විසින්ම 2018.08.02 දින ලියා සහතික කරන ලද අංක 3476 දරණ උකස්කරය මඟින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන (2003 අංක 15 සහ 2011 අංක 45 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනතින් සංශෝධිත) 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ඉහත කී ණයකරු විසින් උකස් කරන ලදුව එකී උකස්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරයන් යටතේ රුපියල් හැත්තෑදෙලක්ෂ හැත්තෑඑක් දහස් අටසිය පනස්පහයි ශත අට (රු. 7,271,855.08) ක මුදලක් වර්ෂ 2020.09.30 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(01)

පළමු ණය මුදල - 702725000071

එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් විසිහත් ලක්ෂ පහළොස් දහස් පන්සිය හැත්තෑහයයි ශත පනහ (රු. 2,715,576.50) ක මුදල ද වර්ෂ 2020.09.30 වන දින දක්වා හිඟ මුදල වශයෙන් රුපියල් දාහත් ලක්ෂ තිස්හත් දහස් හත්සිය අසූඅටයි ශත අනූඑක (රු. 1,737,788.91) ක්ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් හතලිස්හතර ලක්ෂ පනස්තුන් දහස් තුන්සිය හැටපහයි ශත හතලිස්එක (රු. 4,453,365.41) ක මුදල ද,

දෙවන ණය මුදල - 702725000104

එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් දහසය ලක්ෂ අනූහතර දහස් හත්සිය හයයි ශත හතලිස්හත (රු. 1,694,706.47) ක මුදල ද වර්ෂ 2020.09.30 වන දින දක්වා හිඟ මුදල වශයෙන් රුපියල් එකොළොස් ලක්ෂ විසිතුන් දහස් හත්සිය අසූතුනයි ශත විස්ස (රු. 1,123,783.20) ක්ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් විසිඅට ලක්ෂ දහඅට දහස් හාරසිය අසූනවයයි ශත හැටහත (රු. 2,818,489.67) ක් ද වශයෙන් ණය මුදල් දෙකෙහි සම්පූර්ණ එකතුව රුපියල් හැත්තෑදෙලක්ෂ හැත්තෑඑක් දහස් අටසිය පනස්පහයි ශත අට (රු. 7,271,855.08) ක් ද,

(02) එකී පළමු ණය මුදලෙහි අපසු නොගෙවූ මුදල වන රුපියල් විසිහත් ලක්ෂ පහළොස් දහස් පන්සිය හැත්තෑහයයි ශත පනහ (රු. 2,715,576.50) ක මුදල මත අයවිය යුතු වර්ෂයකට 17.50% ක් ද සහ දෙවන ණය මුදලෙහි අපසු නොගෙවූ මුදල වන රුපියල් දහසය ලක්ෂ අනූහතර දහස් හත්සිය හයයි ශත හතලිස්හත (රු. 1,694,706.47) ක මුදල මත අයවිය යුතු වර්ෂයකට 17.50% ක් ද බැගින් වූ පොලිය 2020.10.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා ද,

(03) 2020.10.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) ඉහත කී සම්පූර්ණ හිඟ මුදල වන රුපියල් විසිඅට ලක්ෂ තිස්හය දහස් එකසිය හැත්තෑඑකයි ශත අනූඑක (රු. 2,836,171.91) ක මුදල මත මාසිකව 1.50% ක ප්‍රමාද පොලියක් අයකර ගැනීම සඳහා ද,

(04) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වන වගන්තිය යටතේ අයකල හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරයන් මඟින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව වෙත උකස් කොට

ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකරු පී. කේ. ඊ. සේනාපති යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි (කලින් කල සංශෝධිත) 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2020 ක් වූ ඔක්තෝබර් මස 28 වන දින පැවැති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී.

### ඉහත කී උපලේඛනය

උතුරුමැද පළාතේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, එගොඩ පත්තුවේ, වැලිකන්ද ප්‍රාදේශීය සභා සීමාවේ සහ වැලිකන්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, අංකඃ 262 - මහවැව ග්‍රාම නිලධාරී වසමේ මහවැව ග්‍රාමයෙහි පිහිටි මහවැවකැලේ නමැති ඉඩමට 2017.02.28 වන දින ඩබ්ලිව්. ඩබ්ලිව්. එල්. එල්. ගාමිණී බලයලත් මිනින්දෝරු තැන විසින් මැන සම්පාදිත අංකඃ 2365 පිඹුර ප්‍රකාර කැබලි අංක 1 නමැති ඉඩම් කොටසට මායිම්, උතුරට ඃ පිඹුරු අංක අ.ජ.පි.පො.539 හි කැබලි අංක 03 හා කැබලි අංක 18 ද, නැඟෙනහිරට ඃ පිඹුරු අංක අ.ජ.පි.පො.539 හි කැබලි අංක 18 හා කැබලි අංක 07 ද, දකුණට ඃ පිඹුරු අංක අ.ජ.පි.පො.539 හි කැබලි අංක 07 හා කැබලි අංක 20 ද සහ බටහිරට ඃ පිඹුරු අංක අ.ජ.පි.පො.539 හි කැබලි අංක 20 හා කැබලි අංක 03 ද යන මායිම් තුළ පිහිටි රූඩ් දෙකයි පර්චස් තිහයි දශම තුනයි පහක (අක්. 0, රූ. 02, පර්. 30.35) හෙවත් හෙක්ටෙයාර් බිංදුවයි දශම දෙකයි හතයි නවයයි එකක (හෙක්. 0.2791) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් ගොඩනැගිලි, ගහකොළ පලතුරු ආදී සියළු දේ ද සමග වේ.

ඉහත සඳහන් කැබලි අංක 1 නමැති ඉඩම, පහත විස්තර කර ඇති ඉඩමට සමාන වූවකි.

ඉහත සඳහන් සීමා මායිම් තුළ, මහවැව ග්‍රාමයෙහි පිහිටි සර්වේයර් ජනරාල් විසින් සාදනු ලැබ ඔහු භාරයේ ඇති අංක අ.ජ.පි.පො. 539/1/1 දරන පිඹුර ප්‍රකාර කැබලි අංක 19 නමැති ගොඩ ඉඩම් කොටසට මායිම්, උතුරට ඃ කැබලි අංක 03 හා කැබලි අංක 18 ද, නැඟෙනහිරට ඃ කැබලි අංක 18 හා කැබලි අංක 07 ද, දකුණටඃ කැබලි අංක 07 හා කැබලි අංක 20 ද සහ බටහිරට කැබලි අංක 20 හා කැබලි අංක 03 ද යන මායිම් තුළ පිහිටි හෙක්ටෙයාර් බිංදුවයි දශම දෙකයි හතයි නවයයි එකක (හෙක්. 0.2791) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් ගොඩනැගිලි, ගහකොළ පලතුරු ආදී සියළු දේ ද සමඟ පොළොන්නරුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක LDO/H/21/56 හි ලියාපදිංචි කර ඇත.

මෙම ඉඩම අංක පො/බී/සෙ/ප්‍ර/3169 (ගොඩ) දරන ප්‍රදාන පත්‍රයේ සඳහන්, (464 වන අධිකාරිය වූ) ඉඩම් සංවර්ධන ආඥා පනතේ විධි විධානවලට සහ රක්ෂිත වගන්ති හා කොන්දේසිවලට යටත්ව බැංකුවට උකස් කිරීම සඳහා, ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ බී කලාපයේ නියෝජ්‍ය නේවාසික ව්‍යාපාර කළමනාකරු (ඉඩම්) විසින් පූර්ව අනුමැතිය ඔහුගේ යොමු අංක බී/ඉ/3/8/16 දරන 2017.02.22 දිනැති ලිපියෙන් ප්‍රදානය කර ඇත.

### දෙවන උපලේඛනය

**රක්ෂිත වගන්ති**

1. ඉඩමෙහි හා එය මතුපිට ඇති සියළු ඛණිජ ද්‍රව්‍ය (මේ ප්‍රදාන පත්‍රයෙහි ඛණිජ ද්‍රව්‍ය යන යෙදුම සම්බන්ධයෙන් මැණික් ගල් ද ඇතුළත් වේ.) පිළිබඳ හිමිකම් හා එවැනි යම් ඛණිජ ද්‍රව්‍ය හෑරීමේ, සෙවීමේ, ඒ පිළිබඳව කටයුතු කිරීමේ හා බැහැර ගෙන යෑමේ අයිතිය රජය වෙත වෙන්කර තබා ගනු ලැබේ.

2. ඉඩමට ඇති අයිතිකරුගේ හිමිකම මේ ප්‍රදාන පත්‍රයේ දිනට එම ඉඩම මත ඇති මාර්ග අයිතියනට හෝ වෙනත් පරවශතාවයකට යටත් විය යුතුය.

**කොන්දේසි**

1. මෙහි සඳහන් අවම අනු බෙදුම් ඒකකය, එනම් උස්බිම් හෙක්ටෙයාර් 0.100 ට හෝ වාරිමාර්ග පහසුකම් සහිත ඉඩම් හෙක්ටෙයාර්/අක්කර ................ ට වඩා ප්‍රමාණයෙන් අඩු වූ මෙම ඉඩමේ බෙදා වෙන් කළ කොටසක්/අයිතිකරු විසින් බැහැර නොකළ යුතුය.

2. මෙහි නියමිත අවම භාගයට වඩා අඩු එනම්, හෙක්ටෙයාර් 0.100 වඩා අඩු මෙම ඉඩමේ නොබෙදා වෙන් කළ කොටසක් අයිතිකරු විසින් බැහැර නොකළ යුතුය.

3. කිසිම තැනැත්තකු 1 වන කොන්දේසියේ සඳහන් අවම අනු බෙදුම් ඒකකයට වඩා අඩු ප්‍රමාණයක් වූ ඉඩමේ බෙදූ කොටසක අයිතිකරු නොවිය යුතුය.

4. 2 වන කොන්දේසියේ සඳහන් අවම භාගයට අඩු වූ ඉඩමේ නොබෙදූ කොටසකට කිසිම තැනැත්තකු අයිතිකරු නොවිය යුතුය.

5. ඉඩමට හෝ එහි කිසියම් කොටසකට ජලය සැපයිය හැකි නම් හෝ දැනටමත් ඉදිකර ඇති යම් වාරිමාර්ග කාර්යයන් ඉදිකිරීමක් හෝ ඉදිකිරීමට ඇති යමක් හේතුවෙන් ජලය සැපයිය හැකි බවට පත්වන්නේ නම් හෝ එම ජලය සැපයිය හැකි ප්‍රදේශය සම්බන්ධයෙන් අයිතිකරු (453 වන අධිකාරය වූ) වාරිමාර්ග ආඥා පනතේ විධි විධානවලට හා ඒ යටතේ සාදන ලද රීතිවලට අනුකූලව කටයුතු කළ යුතුය.

6. දිසාපතිවරයාගෙන් ලිඛිත අවසරය දී උචිත බලධරයාගෙන් බලපත්‍රයක් ද ලබා ඇත්නම් මිස, අයිතිකරු විසින් ඉඩමෙහි හෝ ඒ මතුපිට කිසිම ඛණිජ ද්‍රව්‍යයක් කැණීම, සෙවීම, ලබා ගැනීම, තමාගේ ප්‍රයෝජනයට ගැනීම, විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම නොකළ යුතුය.

7. ප්‍රාදේශීය ලේකම්වරයාගේ පූර්ව ලිඛිත අවසරයක් ඇතිව මිස, ඉඩමෙහි හෝ එහි කිසිම කොටසක අයිතිය බැහැර නොකළ යුතුය.

පොළොන්නරුව ප්‍රසිද්ධ නොතාරිස් ආරියසේන ගාල්ලගේ විසින් 2017.05.25 දින ලියා සහතික කරන ලද අංක 3285 දරන උකස්කරය සහ එකී නොතාරිස් තැන විසින්ම 2018.08.02 දින ලියා සහතික කරන ලද අංක 3476 දරන උකස්කරය අනුව මෙහි දක්වා ඇති උපලේඛනය පරීක්ෂා කරන ලදි.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සාමාන්‍යාධිකාරිතුමා.

2020 ඔක්තෝබර් මස 28 වැනි දින,
ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව,
ජාතික නිවාස සංවර්ධන අධිකාරී ගොඩනැගිල්ල,
ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාර්ඩිනර් මාවත,
තැ. පෙ. 2085,
කොළඹ - 02.

1 - 190

---

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

2011 අංක 01 සහ 2011 අංක 19 මගින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

අයි. සෙල්ලමුත්තු සහ වී. එස්. පෙරේරා.
ගිණුම් අංක : 0212 5000 0755.

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2020.10.29 වැනි දින පවත්වන්නට යෙදුන රැස්වීමේදී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන හා කොළඹ 02, ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත, අංක 110හි ලියාපදිංචි කාර්යාලය පිහිටි සම්පත් බැංකුව පීඑල්සී නමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. එම්. නාගොඩවිතාන යන අය විසින් ලියා සහතික කරන ලද 2014 ජූනි 04 දතම හා අංක 757 දරන, සහ ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ඩබ්ලිව්. ඩී. එම්. විතානගේ යන අය විසින් ලියා සහතික කරන ලද 2017 සැප්තැම්බර් 25 දතම හා අංක 1743 දරන උකස් බැඳුම්කර මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසුගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අයිරින් සෙල්ලමුත්තු සහ විතානගේ සරත් පෙරේරා යන අය බන්ධනදායීන් වශයෙන් හා එකී අයිරින් සෙල්ලමුත්තු යන අය උකස්කරු වශයෙන් පැහැර ඇති හෙයින් ද, එකී අංක 757 සහ 1743 දරන උකස් බැඳුම්කර ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් අසූහත් ලක්ෂ හතලිස් දෙදහස් තිස් එකයි ශත පනස් හයක (රු. 8,742,031.56) මුදලක් 2020 සැප්තැම්බර් 09 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් අසූහත් ලක්ෂ හතලිස් දෙදහස් තිස් එකයි ශත පනස් හයක (රු. 8,742,031.56) මුදල ද, 2020 සැප්තැම්බර් මස 10 වැනි දින සිට අංක 757 සහ 1743 දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් අසූඑක් ලක්ෂයක (රු. 8,100,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ හතරක් (14%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 757 සහ 1743 දරන එකී උකස් බැඳුම්කරය මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස් කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලියයුතු යයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, කළුතර තොටමුණේ උතුර කළුතර බැද්ද කළුතර ප්‍රාදේශීය සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසය තුළ පලාතොට උතුර අංක 723E දරන ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ පලාතොට ග්‍රාමයේ පිහිටි ''මෙස්ත්‍රියවත්ත '' යැයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එන්. එම්. එම්. ද සිල්වා යන අය විසින් සාදන ලද 2014 අප්‍රේල් 16 දතම හා අංක 2226 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙද වෙන්කොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ජොකොන්ගේවත්ත සහ කළුතර සී ආර් 1217 දරන නඩු අංකය සටහන් කොට ඇති අංක 436 දරන පිඹුරේ වලකඩවත්ත ලොට් 1, 4 සහ 5 සහ මෙම ඉඩමේ ලොට් B ද, නැගෙනහිරට : ජොකොන්ගේවත්ත සහ කළුතර සී ආර් 1217 දරන නඩු අංකය සටහන් කොට ඇති අංක 436 දරන පිඹුරේ වලකඩවත්ත ලොට් 1, සහ 4 සහ 5, දකුණට : තාප්පේකොට්ටුව බස්නාහිරට : මෙම ඉඩමේ ලොට් B සහ කුඹුර යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් අක්කර එකයි පර්චස් දහ අටක් (අ. 01, රූ. 00, පර්. 18) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සෑම සියළු දේ සමග අංක 2226 දරන එකී පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව C75/24 යටතේ කළුතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,

සමාගම් ලේකම්.

11 - 176

**සම්පත් බැංකුව පීඑල්සී**
**(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)**

2011 අංක 01 සහ 2011 අංක 19 මගින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදනය කරන ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

එච්. ඒ. එන්. පී. සෙනවිරත්න.
ගිණුම් අංක : 0207 5000 0089.

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2020.10.29 වැනි දින පවත්වන්නට යෙදුන රැස්වීමේදී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන හා කොළඹ 02, ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත, අංක 110හි ලියාපදිංචි කාර්යාලය පිහිටි සම්පත් බැංකුව පීඑල්සී නමින් ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ඩබ්ලිව්. ඩී. එම්. විතානගේ යන අය විසින් ලියා සහතික කරන ලද 2017 අගෝස්තු 28 සහ 30 දතම හා අංක 1635 දරන, සහ 2019 අගෝස්තු 16 සහ 20 දතම හා අංක 3657 දරන උකස් බැඳුම්කර දෙක මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසුගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ හේවා ආරච්චිගේ නාමලී ප්‍රීතිකා සෙනවිරත්න යන අය බන්ධනදයී වශයෙන් පැහැර ඇති හෙයින් ද, එකී අංක 1635 සහ 3657 දරන උකස් බැඳුම්කර ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් හැටපන් ලක්ෂ හැට පන්දහස් අටසිය දහතයි ශත අටක (රු. 6,565,817.08) මුදලක් 2020 ඔක්තෝබර් 05 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් හැටපන් ලක්ෂ හැට පන්දහස් අටසිය දහතයි ශත අටක (රු. 6,565,817.08) මුදල ද, 2020 ඔක්තෝබර් මස 06 වැනි දින සිට අංක 1635 සහ 3657 දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් පනස් අට ලක්ෂයක (රු. 5,800,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ හතරක් (14%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 1635 සහ 3657 දරන එකී උකස් බැඳුම්කරය මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස් කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලියයුතු යයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අදිකාරි පත්තුවේ, බියගම ප්‍රාදේශීය සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහලේකම් කාර්යාල කොට්ඨාසයේ පමුණුවිල අංක 265 දරන ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ පමුණුවිල ග්‍රාමයේ පිහිටි පමුණුවිල පාර වරිපනම් අංක 153 දරන "ජයකොඩිවත්ත " යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එස්. සමරවික්‍රම යන අය විසින් සාදන ලද 1995 අගෝස්තු 17 දතම හා අංක 287/1995 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදවෙන්කොට ලොට් B2 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : D. D. C. පාර ද, නැගෙනහිරට : ලොට් B1, දකුණට : ලොට් B3, බස්නාහිරට : පාර ලොට් B6 (අඩි 8 පිවිසුම) යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහයයි දශම හතයි බිංදුවක් (අ. 00, රූ. 0, පර්. 10.70) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සමග අංක 287/1995 දරන එකී පිඹුරට අනුව වෙළුම/පත්‍ඉරුව N448/5 යටතේ ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,

සමාගම් ලේකම්.

11 - 177

---

**සම්පත් බැංකුව පීඑල්සී**
**(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)**

2011 අංක 01 සහ 2011 අංක 19 මගින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදනය කරන ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

එච්. ආර්. කේ. ඩබ්ලිව්. කේ. කුමාර සහ එච්. ආර්. කේ. විපුලසේන.
ගිණුම් අංක : 0060 5000 9538.

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2020.10.29 වැනි දින පවත්වන්නට යෙදුන රැස්වීමේදී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන හා කොළඹ 02, ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත, අංක 110හි ලියාපදිංචි කාර්යාලය පිහිටි සම්පත් බැංකුව පීඑල්සී නමින් ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ඩබ්ලිව්. ඩී. එම්. විතානගේ යන අය විසින් ලියා සහතික කරන ලද 2015 දෙසැම්බර් 21 දතම හා අංක 354 දරන, සහ 2017 අගෝස්තු 15 දතම හා අංක 1575 දරන උකස් බැඳුම්කර දෙක මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට

තබාගෙන ලබාදුන් ණය මුදල ආපසුගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ හේවා රයිගම් කෝරළේ විමල් කැලුම් කුමාර සහ හේවා රයිගම් කෝරාළගේ විපුලසේන යන අය බන්ධනදායී වශයෙන් සහ හේවා රයිගම් කෝරළේ විමල් කැලුම් කුමාර යන අය උකස්කරු වශයෙන් ද පැහැර ඇති හෙයින් ද, එකී අංක 354 සහ 1575 දරන උකස් බැඳුම්කර ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වංලගු මුදලින් රුපියල් එක්කෝටි හැත්තෑ දෙලක්ෂ හැත්තෑ තුන් දහස් තුන්සිය දහයයි ශත හැට නවයක (රු. 17,273,310.69) මුදලක් 2020 සැප්තැම්බර් 10 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් එක්කෝටි හැත්තෑ දෙලක්ෂ හැත්තෑ තුන් නදහස් තුන්සිය දහයයි ශත හැට නවයක (රු. 17,273,310.69) මුදල ද, 2020 සැප්තැම්බර් මස 11 වැනි දින සිට අංක 354 සහ 1575 දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් එක්කෝටි පනස් පන් ලක්ෂයක (රු. 15,500,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහතුනයි දශම පහක් (13.5%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 354 සහ 1575 දරන එකී උකස් බැඳුම්කරය මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස් කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලියයුතු යයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

**උපලේඛනය**

